## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව - 2014

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් , අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2 මූල්‍ය ප්‍රකාශන

## 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

#### (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 01

වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකල යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට වූ බැංකු ගිණුම් 12 කට අදාල එකතුව රු.42,968,894 ක් වූ බැංකු අයිරා ශේෂයන් ජංගම බැරකම් යටතේ දැක්වීම වෙනුවට ජංගම වත්කම්වලින් හිලව්කර දක්වා තිබුණි.

#### (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 02

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මුදලින් සිදුකරන ගනුදෙනු පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල ගැලපුම් කළ යුතු අතර නාමමාත්‍රික සටහන්වල ගැලපීම් සිදු නොකළ යුතු වුවත්, රු.819,431,527 ක් වූ සංචිත හා රු.58,638,240 ක් වූ ප්‍රාග්ධන වත්කම් ක්‍රමක්ෂය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපුම් කර තිබුණි.

(ii) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය නොවූ ආදායම් එයින් ඉවත්කර අදාල ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවත්,සමාලෝචිත වර්ෂයට අදාල ණය පොළී ආදායම වූ රු.341,081 සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) වර්ෂය තුල ස්ථාවර වත්කම් ඉවත්කිරීමෙන් ලද මුදල් රු.5,977,500 ක් ද වත්කම් ඉවත්කිරීමේ ලාභය රු.2,778,629 ක් හා අලාභය රු. 826,554 ක් ද මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණු අතර රු.30,182,688 ක් වූ ස්ථාවර වත්කම් වලට එකතුකිරීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු.853,416,012 ක් ලෙස ගැලපුම් කර තිබුණි.මේ හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තුල්‍යතාවය විගණනයේදී ගැටළු සහගත විය.

#### (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07

වත්කම් භාවිතා කිරීමට හැකි තත්ත්වයට පත්වූ වහාම ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද, ඊට පටහැනිව වත්කම් මිලදීගත් වර්ෂය සඳහා සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ අතර, විකුණන වර්ෂයේදී ක්ෂය කර නොතිබුණි. තවද එක් එක් වත්කම වෙන වෙනම හඳුනාගෙන ක්ෂය කරනු වෙනුවට සමස්ත වත්කම්හි ගත්මිල මත ක්ෂය කර තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 08**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සංස්ථාවට එරෙහිව පෞද්ගලික ආයතනයක් විසින් පවරණ ලද නඩුවකට අදාලව ලබා දී තිබූ අවාසිදායක තීන්දුව ප්‍රකාර සංස්ථාව විසින් ගෙවිය යුතු වන්දි මුදල වන රු. 981,115 ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදු කර නොතිබුණි.

(ii) විවිධ පාර්ශවයන් විසින් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට එරෙහිව පවරා ඇති නඩු තුනක් සම්බන්ධයෙන් පවතින මුළු අසම්භාව්‍ය වගකීම් රු.3,049,500 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) යම් නිශ්චිත ගිණුම් කටයුත්තක් වෙනුවෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතාකරන ලද ගිණුම්කරණ ක්‍රමයෙන් ආවරණය නොවන්නේ නම් එහිදී වඩාත්ම යෝග්‍ය ආකාරයට (best practice) ගිණුම්කරණ ප්‍රතිපත්තියක් පිළියෙල කර එය අනුගමනය කලයුතු වුවත්, සංස්ථාව විසින් රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) වත්කම්හි සාධාරණ වටිනාකම ප්‍රමාණාත්මක මට්ටමින් වෙනස්වන විට , එම වත්කම් සෑම වසර 3 කට හෝ 5 කට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද , සංස්ථාව විසින් 2007 න් පසුව වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඇ) අඩමාණ ණය වෙන්කිරීම් සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.7,697,129 ක් අඩමාණ ණය ලෙස වෙන්කර තිබුණි.

(ඈ) ප්‍රයෝජනවත් ආයුකාලය පිළිබඳව ඇගයීමකින් තොරව වෙනත් වත්කම් ක්ෂය කරනු ලබන ක්ෂය රේටය පරිගණක යන්ත්‍ර ක්ෂය කිරීම සඳහා යොදාගෙන තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුඩාවැල්ල ධීවර වරායෙහි මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථානය කඩා ඉවත්කර එහි භාණ්ඩ අත්පත් කර ගැනීමකින් තොරව ඒ සඳහා අදාල කොන්ත්‍රාත්කරු වෙතින් ලැබී තිබූ රු.8,800,000 ක මුළු මුදලින් රු.3,800,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ආ) ප්‍රදාන වශයෙන් ලැබී තිබූ වටිනාකම රු.824,485,700 ක් වූ වත්කම් ක්ෂය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්ෂය රු.14,458,095 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) කොඩ්බේ වරායේ ලිස්සුම් මග ඉදිකිරීම සඳහා ගෙවිය යුතු වියදම් රු.8,319,730 ක් ගිණුම්ගතකර නොතිබීම නිසා ස්ථාවර වත්කම් හා ගෙවිය යුතු වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) පුරාණවැල්ල ධීවර වරායේ ඉන්ධන තොග අඩුවීම ගිණුම්ගත කර නොතිබුණු අතර , ඒ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන තිබූ රු.574,739 ක් තොගයෙන් අඩු කරනු වෙනුවට ණයගැතියන්ගෙන් අඩුකර දක්වා තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන සමුච්චිත ක්ෂය හා සමාලෝචිත වර්ෂයේ ක්ෂය , අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳීමේදී රු.471,108 ක වෙනසක් පැවතුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම | විගණනය සඳහා ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 4,473,127,854 | විස්තරාත්මක උපලේඛන |
| ඉන්ධන ණයගැතියෝ | 54,814,826 | විස්තරාත්මක උපලේඛන ශේෂ සනාථකිරීම් හා හා කාල විශ්ලේෂණ |
| අනෙකුත් තැන්පතු | 4,509,025 | |
| පොම්ප් ප්‍රීව්ඩ් ලැබීම් | 2,215,769 | විස්තරාත්මක උපලේඛන |
| විලම්භිත බැරකම් | 1,653,400 | |
| ලියා හැරිය යුතු ශේෂ | 81,769,596 | |
| එකතුකල අගය මත බදු | 73,798,069 | |
| බැංකු ආරක්ෂණ තැන්පතු | 2,843,310 | |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මිලදීගැනීම් සඳහා ඉදිරියට කළ ගෙවීම් වටිනාකම වූ රු.38,972,543 තුල වසර 10 ට වැඩි වසර 05 ට වැඩි සහ වසර 01 ත් 05 ත් අතර දක්වා වූ ශේෂයන් පිළිවෙලින් රු.15,593,826 ක් , රු.9,048,319 ක් සහ රු.12,741,341 ක් විය.

(ආ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වැඩිපුර ගෙවා තිබූ වසර 10 කට වඩා පැරණි රු.10,434,783 ක් සහ අමාත්‍යාංශ හා අනෙකුත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබිය යුතු වසරකට වඩා පැරණි රු.2,150,000 ක් සමාලෝචිත වර්ෂය තුලදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වසර 05 කට අධික කාලයක සිට පැවත එන එකතුව රු.81,769,596 ක් වූ හඳුනානොගත් ගිණුම් ශේෂ හා අත්තිකාරම්, එකතුව රු.93,901,599 ක් වූ ණයහිමියෝ සහ තැන්පතු ශේෂ සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වසර 03 ක කාලයක සිට පැවත එන වරායන් සඳහා දෙන ලද අත්තිකාරම් රු.15,879,986 ක් සහ ගෙවිය යුතු ආර්ථික සේවා බදු රු.10,512,971 ක් සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මෝදර ධීවර වරාය තුල නැංගුරම් ලා තිබූ යාත්‍රාවකින් 2009 වර්ෂයේ සිට 2011 ජූලි මාසය දක්වා අයවිය යුතුව තිබූ රු. 5,675,373 ක නැංගුරම් ගාස්තු අයකර ගෙන නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 137(5) | ලැබුණු බවට සනාථකර ගැනීමකින් තොරව දිනපොත් 2000 ක් සඳහා පෞද්ගලික ආයතනයකට රු.1,090,000 ක් ගෙවා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 187 | වටිනාකම රු.704,539 ක් වූ දෛනික ආදායම් බැංකුගත කිරීමකින් තොරව එදිනෙදා වියදම් දැරීමට යොදාගෙන තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 396 (ඈ) | බැංකු ගිණුම් 05 කට අදාලව නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල මාස 06 ඉක්මවූ එකතුව රු.996,450 ක් වූ චෙක්පත් 49 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය අනුව කටයුතු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | එකතුව රු.මිලියන.5,161 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත්, වටිනාකම රු.මිලියන 50 ක් වූ පරිගණක සම්බන්ධයෙන් එවැනි ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i) 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන චක්‍රලේඛය | වැඩ බැලීමේ දීමනාව ගෙවිය හැකි උපරිම කාලය මාස තුනක් වුවද, එම සීමාවන්ට පටහැනිව සංස්ථාව විසින් නිලධාරීන් 06 දෙනෙකු සඳහා වැඩ බැලීමේ දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළ එකතුව |

| | | |
|---|---|---|
| | | රු.777,429 ක් ගෙවා තිබුණි. |
| (ii) | 2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන චක්‍රලේඛය | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නිලධාරින් සඳහා හිමි රු.15,000 ක දීමනාව අනුමැතියකින් තොරව සංස්ථා නිලධාරින් 07 දෙනෙකු වෙත ගෙවීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.1,155,000 ක් වැයකර තිබුණි. |
| (ඇ) | 2004 අගෝස්තු 31 දිනැති අංක 353 (5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළ කුලී පදනම මත වාහන 08 ක් ලබාගැනීමේදී ගෙවිය හැකි මාසික කුලී සීමාව ඉක්මවා රු.380,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඉ) | 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ස්ථිර, තාවකාලික, අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම් අත්හිටුවිය යුතු වුවද, ඊට පටහැනිව නීති උපදේශක, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ මුදල් උපදේශක යන තනතුරු සඳහා බඳවාගෙන පිළිවෙලින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සඳහා 2014 ජනවාරි සිට මාසයකට රු.50,000 බැගින් රු.600,000 ක්ද, මුදල් උපදේශක සඳහා 2014 නොවැම්බර් සිට මාසිකව රු.90,000 බැගින් රු.180,000 ක් ද නීති උපදේශක සඳහා 2014 ජූලි සිට මාසිකව රු.60,000 බැගින් රු.300,000 ක් ද ගෙවා තිබුණි. |
| (ඊ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.14.1 වගන්තිය | අවම වශයෙන් සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන්වත් මිල කැඳවීම් ලබාගැනීමකින් තොරව කිරින්ද ධීවර වරායේ සදගලපියස බංගලාව සඳහා රු.122,399 ක වායුසමීකරණ යන්ත්‍රයක් ලබාගෙන තිබුණි. |
| (උ) | 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | කළමනාකාර අධ්‍යක්ෂ වෙත ගෙවනු ලබන රු.40,000 ක් වූ මාසික දීමනාවට අමතරව මාසිකව රු.30,000 බැගින් 2014 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා රු.270,000 ක දීමනා ගෙවා තිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී නව ධීවර යාත්‍රාවක් දියඹට දියත් කිරීමේ උත්සවය වෙනුවෙන් ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව වේදිකා ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත රු.2,093,160 ක් ගෙවීම ඇතුළුව රු.3,769,509 ක් වැයකර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1. මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.136,861,294 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.41,511,370 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.95,349,924

ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පුනරාවර්තන ප්‍රදාන රු.205,400,000 කින් වැඩි වුවද මෙහෙයුම් ආදායම රු.250,495,530 කින් අඩුවීම සහ කාර්යමණ්ඩල වියදම හා අළුත්වැඩියා හා නඩත්තු වියදම් පිළිවෙලින් රු.26,864,261 කින් හා රු.17,015,879 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව යටතේ ක්‍රියාත්මක වූ ධීවර වරායන් 21 න් වරාය 14 ක් ම සමාලෝචිත වර්ෂය තුල මෙහෙයුම් අලාභ ලබා තිබූ අතර සමාලෝචිත හා ඉකුත් වර්ෂයන්හි එක් එක් වරායන්වල ලාභ අලාභ තත්ත්වයන් පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුල අලාභ ලැබූ වරායන් 14 න් 10 ක් ම ඉකුත් වර්ෂයේදී අලාභ ලබා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ද ලබා තිබූ අලාභයේ එකතුව රු.97,234,283 ක් විය. ඒ අතරින් තංගල්ල , දොඩන්දූව , හික්කඩුව , කල්පිටිය සහ හම්බන්තොට යන වරායන් 05 හි අලාභය ඉකුත් වසර 05 තුල වැඩිවෙමින් පැවතුණි. තවද හලාවත , වාලච්චේන හා නිල්වැල්ල යන වරායන් වසර 03 ක සිට අඛණ්ඩව අලාභ ලබා තිබුණි.

(ii) බේරුවල , ගාල්ල , මිරිස්ස හා මෝදර යන ධීවර වරාය හතරෙහි මෙහෙයුම් ලාභය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී අඩුවී තිබුණි.

(iii) අලාභ ලබන වරායන්වල අලාභ ලැබීමට හේතුන් අධ්‍යයනය කර ලාභ ලබන තත්ත්වයකට ගෙනඒම හෝ අලාභ අඩුකර ගැනීම සහ ලාභය අඩුවෙමින් පවතින වරායන්වල එය වැඩිකරගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ වරායන්වල මුළු මෙහෙයුම් ලාභයෙන් සියයට 73 ක් පමණ ඉපැයූ මෝදර ධීවර වරාය 2014 ඔක්තෝබර් 30 දින සිට අවිධිමත් අයුරින් මාසයක රු.125,000 කට බදු දීම නිසා ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අහිමි වූ ලාභය රු.මිලියන 7.6 ක් විය.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් කැටපිලර් යන්ත්‍රයක ප්‍රධාන එන්ජිම අළුත්වැඩියා කිරීම සඳහා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන වලින් බැහැරව රු.5,911,995 ක ගිවිසුම්ගත වටිනාකමකට සැපයුම් ආයතනයක් තෝරාගෙන සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අත්තිකාරම් වශයෙන් රු.1,055,713 ක් ගෙවා තිබුණි.

(ආ) 2007 වර්ෂයේදී තෙල්ටැංකි 06 ක් ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා ගිවිසුම්ගත වීමකින් තොරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අභිබවා යමින් සියයට 60 ක අත්තිකාරම් මුදලක් ලෙස රු.3,000,000 ක් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. අදාල කාර්යය සම්පූර්ණ කරවීමට හෝ අලාභ අයකර ගැනීමට හෝ කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඇ) රජයේ තක්සේරුකරුවකුගෙන් තක්සේරු වාර්තාවක් ලබාගැනීමකින් තොරව හා ගිවිසුම්ගතවීමකින් තොරව පානදුර ධීවර වරාය සතු දේපළවලින් කොටසක් රු.150,000 ක මාසික කල්බදු වාරිකයකට පෞද්ගලික ආයතනයකට බදු දී තිබුණි.

(ඈ) සංස්ථාව විසින් 1996 මැයි 08 දින සිට තාවකාලික පදනම මත කාර්යාල කාර්ය සහායක තනතුරට පත්කර ඇති නිලධාරිණියක් නියමිත පරිදි රාජකාරී කටයුතු ඉටු නොකිරීම සම්බන්ධයෙන් අවස්ථා 06 ක දී ලිඛිත අවවාද කිරීම්වලට යටත්ව සිටියදී හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබියදී අක්‍රමික ආකාරයට ලිපිකරු I ශ්‍රේණියට උසස්වීම් ලබාදී තිබුණි.

මේ සම්බන්ධයෙන් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ 2011 අගෝස්තු 15 දිනැති අංක 1/5/1/1/8Min(ii) දරන ලිපිය මගින් මෙම පත්වීම නීතිරීති වලට පටහැනි බවත්, එබැවින් නිලධාරිණියගේ අධ්‍යාපන සුදුසුකම්වලට ලබාදිය හැකි වෙනත් තනතුරකට පත්කරන ලෙසත් දන්වා තිබුණද , මේ දක්වාම අදාල නියෝගය සංස්ථාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ නිලධාරීන් විසින් හදාරන ලද බාහිර පාඨමාලා වෙනුවෙන් රු.982,150 ක් සංස්ථාව විසින් ගෙවා තිබුණද එම පාඨමාලා සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී විනිවිදභාවයක් දක්නට නොලැබුණ අතර , එම නිලධාරීන්ට රාජකාරීමය අවශ්‍යතාවයන් සඳහා පාඨමාලා යෝග්‍ය වේද යන්න සලකා බලන බවක් විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(ඊ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අනුමත බැංකු අයිරා සීමාව රු.මිලියන 25 ක් වුවද, එක් බැංකු ගිණුමක් සඳහා එකී සීමාව ඉක්මවා රු.මිලියන 27 ක් දක්වා බැංකු අයිරා ලබාගෙන තිබුණි.

(උ) සංස්ථාවේ සභාපතිවරයා වෙත 2013 හා 2014 ගිණුම් වර්ෂවලට අදාලව යොමු කරන ලද විගණන විමසුම් පිළිවෙලින් 22 ක් හා 21 ක් සඳහා 2016 පෙබරවාරි 16 දින දක්වාම පිළිතුරු ලබා දී නොතිබුණි. එම විමසුම්වලට අදාල ගණුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.222,271,550ක් විය.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොත් අනුව පැවතිය යුතු ඉන්ධන තොගය භෞතික ඉන්ධන තොගය සමඟ සැසඳීමේදී රු.5,584,489 ක ඉන්ධන හිඟයක් පැවති අතර කළමනාකරණය විසින් එයට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආසියානු සංවර්ධන බැංකුවේ හා වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ ණය ආධාර මත රු.මිලියන 224 ක වියදමින් ඉදිකර සංස්ථාව වෙත ලබා දී ඇති හලාවත ධීවර වරායේ මෙහෙයුම් කටයුතු 2009 වර්ෂයේදී ආරම්භ කර තිබූ නමුත් මේ දක්වා ධීවර වරායකින් ඉටුවිය යුතු මූලික අරමුණු ඉටුවීමක් සිදුනොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. 2014 දෙසැම්බර් 31 දිනට වරායේ මෙහෙයුම් කටයුතුවලින් රු.5,951,350 ක අලාභයක් ලබා තිබුණු අතර , ඒ අනුව විදේශීය ණය ගෙවීම් හා ඊට අදාල පොලිය ගෙවීම රජයට වැය බරක් පමණක් වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවට අයත් අම්බලන්ගොඩ , වාලච්චේන , හලාවත , කිරින්ද , පානදුර , හම්බන්තොට හා හික්කඩුව යන ධීවර වරායන්හි එකතුවන වැලි හාරා ඉවත්කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2011 නොවැම්බර් 24 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් පෞද්ගලික ආයතන දෙකකට පිරිනැමීම නිර්දේශ කර තිබුණද , 2011 දෙසැම්බර් 13 හා 2012 ජනවාරි 09 යන දිනයන්හි

සියළුම වරායන් වල වැලි ඉවත් කිරීම සඳහා අනුමැතියකින් තොරව එකම ආයතනයට ලබා දී තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී අදාල ආයතනයෙහි කාර්යසාධනය හා හැකියාව ඇගයීමකට ලක් කර නොතිබීම හේතුවෙන් අදාල ආයතනය විසින් ධීවර වරායන් වල වැලි ඉවත් කිරීම් ප්‍රමාදවී තිබුණි. එම කාල සීමාව තුළදී සංස්ථාවට ලැබිය යුතුව තිබූ ආදායම් අහිමි වීමක්ද සිදුවී තිබූ අතර මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සංස්ථාව විසින් එකී පෞද්ගලික ආයතනයට කැණීම් කරන ලද වැලි විකිණීම සිදුකර ඇති අතර ඒ වෙනුවෙන් රු.335,000 ක මුදලක් අදාල ආයතනයෙන් සංස්ථාවට අයවිය යුතු වුවත්, එම මුදල විගණිත දිනය වූ 2015 ජූලි 17 දක්වාම සංස්ථාවට ලැබී නොතිබුණි.

(ii) තවද එම පෞද්ගලික ආයතනයට 2014 අගෝස්තු 01 දින රු.මිලියන 20 ක අත්තිකාරම් මුදලක් එකී ආයතනයේ ඉල්ලීම මත ගෙවා තිබුණු අතර, මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් හෝ ලබාගෙන නොතිබුණි.

(iii) සංස්ථාව සතුව වැලි ඉවත් කිරීම සඳහා භාවිතා කළ හැකි වටිනාකම රු.374,000,000 ක් වූ Cutter Suction වර්ගයේ ඩ්‍රෙජර් 03 ක් සහ වටිනාකම රු.1,069,535,760 ක් වූ Grab Hopper වර්ගයේ ඩ්‍රෙජර් 02 ක් තිබියදී ධීවර වරායන් 07 ක වැලි ඉවත් කිරීමේ කාර්යය පෞද්ගලික ආයතනයකට ලබාදීමෙන් සංස්ථාවට අයත් රාජ්‍ය සම්පත් නිෂ්කාර්ය වීමට ඉඩ හැර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) කිරින්ද වරායේ බේසමෙහි එකතුවන වැලි ඉවත් කිරීම සහ විකිණීමට අදාලව, සංස්ථාව විසින් 2014 අගෝස්තු 01 දින දී පෞද්ගලික ආයතනයක් සමඟ එළඹ තිබූ ගිවිසුම අවලංගු කිරීමකින් තොරව නැවත එම වරායේම වැලි ඉවත් කිරීම සහ විකිණීම සඳහා 2015 ජුනි 30 දින වෙනත් පෞද්ගලික ආයතනයට ලබා දී තිබුණි. 2015 ජුනි 15 දින එම ආයතනය සමඟ ඇති කරගන්නා ලද ගිවිසුමෙහි 02 වන කොන්දේසියට අනුව අදාල ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම එම ආයතනය විසින් සංස්ථාවට රු.200,000 ක අත්තිකාරම් මුදලක් ගෙවිය යුතු වුවත්, විගණිත දිනය දක්වාම එම මුදල සංස්ථාවට ගෙවා නොතිබුණි.

(ඈ) මීගමුව කළපු වෙරළ සංවර්ධනය කිරීමේ උත්සවය වෙනුවෙන් සමරු ඵලකයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත රු.1,848,000 කට පවරා දී තිබූ කොන්ත්‍රාත්තුවට අදාලව සමාලෝචිත වර්ෂය තුල රු.1,000,000 ක් අත්තිකාරම් ලබාදී තිබුණි. සමරුඵලක ඉදිකිරීමේ සැලැස්මට අනුව කලුගලින් අඹන ලද මාළුවකුගේ රූපයක් නිර්මාණය කළ යුතු වුවද, සිමෙන්තියෙන් පිළියෙල කරන ලද මාළුවකුගේ නිර්මාණයක් තිබූ බව 2014 පෙබරවාරි 16 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් පෞද්ගලික ආයතනයක් වෙතින් රු.6,229,440 කට ඉන්ධන පොම්ප 06 ක් මිලදී ගෙන තිබුණු අතර, අදාල සැපයුම්කරුට මුදල් ගෙවීමේදී ඉන්ධන පොම්ප 06 ම අදාල ධීවර වරායන්හි ස්ථානගත කිරීමෙන් පසු මුදල් ගෙවනවා වෙනුවට එක් එක් අවස්ථාවේදී නිමකරන ලද වැඩ අනුව කොටස් වශයෙන් මුදල් ගෙවා තිබුණි. මේ හේතුවෙන් සැපයුම්කරු විසින් ඉන්ධන පොම්ප ස්ථානගත කිරීම ප්‍රමාද කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද ඉන්ධන පොම්ප භාවිතයට සුදුසු බවට නිර්දේශයක් නොමැතිවීම හේතුවෙන් වසරක කාලයක් ගතවීමටත් පෙර දෝෂ සහිත වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අනතුරට පත් කුලී පදනම මත ලබාගෙන තිබූ මෝටර් රථය භාවිතා කිරීමට නොහැකි ලෙස නිර්දේශ කරමින් රක්ෂණ ආයතනය විසින් රු.3,500,000 ක වන්දි මුදලක් පිරිනැමීමට නිර්දේශ කර තිබුණද , වන්දි මුදල ලබාදීමේදී අදාල අනතුර සිදුවන විට සංස්ථාව විසින් ලීසිං සමාගමට ගෙවිය යුතු ශේෂය වූ රු.1,712,510 ක මුදල වෙනුවට ලීසිං

සමාගම විසින් රු.2,227,100 ක මුදලක් වන්දි මුදලෙන් අඩුකරගැනීම විගණනයේදී ගැටලුකාරී විය. ඒ අනුව සංස්ථාවෙන් රු.514,590 ක් වැඩිපුර ලීසිං සමාගම විසින් අයකර ගෙන තිබුණි.

(ඇ) මීගමු කළපු වෙරළ සංවර්ධන වැඩසටහන සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව පිරිවැය රු.1,225,000 ක් වූ ටී ෂර්ට් 1500 ක් හා කැප් 2000 ක් මිලදීගැනීමට කටයුතු කර තිබූ අතර මෙම භාණ්ඩ ලැබූ බවට තහවුරු කර ගැනීමකින් තොරව අදාල පෞද්ගලික ආයතනයට ගෙවීම් කටයුතු කර තිබුණි.

(ඈ) මීගමුව වෙරළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාල කළපු වෙරළ සංවර්ධනය කිරීමේ ආරම්භක උත්සවය සඳහා වන වියදම රු.13,270,000 කට ඇස්තමේන්තු කර ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව පෞද්ගලික ආයතනයක් වෙත අත්තිකාරම් මුදල් ලෙස රු.5,000,000 ක් ගෙවා තිබුණි. එහෙත් එම උත්සවය පැවැත්වූ බවට සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2013 දෙසැම්බර් 19 දින සංස්ථාව වෙත පවරන ලද ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අයිතිව තිබූ රු.4,000,000 ක් වටිනා ජීප් රථය සංස්ථාව විසින් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.652,189 ක් වැයකර තිබුණද 2014 අප්‍රේල් 17 දිනෙන් පසු ධාවනය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.10 ඡේදයට පටහැනිව සංස්ථාව විසින් අයිරා පහසුකම් ලබාගෙන තිබූ අතර, ඒ සඳහා අයිරා පොළිය රු.6,485,293 ක් හා රු.31,966 ක දඩ මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(ආ) නියමිත දිනට සේවක අර්ථසාධක අරමුදල වෙත දායක මුදල් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාව විසින් රු.8,357,906 ක අධිභාරයක් ගෙවා තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බඳවාගැනීමේ පරිපාටිය සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා නොතිබූ අතර අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයන් 128 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) වාර්ෂිකව රු.3,005,880 ක වැටුප් හා දීමනා ගෙවීම් කරනු ලබන නීතිඥ නිලධාරින් දෙදෙනෙක් ඇතුළුව 07 දෙනෙකු නීති අංශයේ සිටියදී පිටතින් නීති උපදේශක සේවා ලබා ගැනීම සඳහා බාහිර පාර්ශවයන් වෙනුවෙන් රු.1,154,660 ක් වැයකර තිබුණි.

**4.8 වෙනත් ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9. හා 9.4 වගන්තිය ප්‍රකාර සංස්ථාවේ සේවකයින් රේඛීය අමාත්‍යාංශයට හෝ වෙනත් ආයතනයකට නිදහස් කරන්නේ නම් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වුවද, ඊට පටහැනිව නිලධාරීන් හා සේවකයන් 17 දෙනෙකු බාහිර ආයතන වෙත මුදා හැර සමාලෝචිත වර්ෂය තුලදී රු.7,318,140ක් වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි. තවද රේඛීය අමාත්‍යාංශයේ හෝ වෙනත් රජයේ ආයතනවලට අදාල වූ වියදම් දැරීමට සංස්ථාවට අවසර නොමැති වුවද, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයාගේ නිල නිවස අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.440,395 ක් සහ අමාත්‍යාංශය වෙනුවෙන් ටී ෂර්ට් 1000 ක් මිලදීගැනීම සඳහා රු.600,000 ක් ගෙවා තිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සංස්ථාවේ සංයුක්ත සැලැස්ම අනුව 2011 සිට 2014 දක්වා ලාභ ලැබීමට අපේක්ෂා කර තිබුණද එකී කාලය තුළ අලාභ ලබා තිබුණි. මෙම තත්ත්වය යටතේ එකී චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය ප්‍රකාරව අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම තහවුරු කරගැනීම සඳහා ප්‍රමාදයකින් තොරව ඵලදායී පියවර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ඉහළ කළමනාකාරීත්වය විසින් ඵලදායී පාලන පද්ධති ස්ථාපිත කර නොමැති බව නිරීක්ෂණය විය.

**5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2011 හා 2012 වසරවලට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) අයවැය පාලනය
(ආ) ආදායම් පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කාර්ය මණ්ඩල පාලනය
(ඊ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය